මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව
மத்தியமாகாணசபையின் அரசசேவைகள் ஆணைக்குழு
Public Service Commission of Central Provincial Council

අංක 244, කටුගස්තොටපාර, මහනුවර
இல. 244,கடுகஸ்தொட்டைவீதி,கண்டி
No. 244, Katugasthota Road, Kandy.

web site: www.psc.cp.gov.lk
e-mail: psc.cp.gov@gmail.com

| | | | |
|---|---|---|---|
| කාර්යාලය / காரியாலயம் / Office: 081-2213097 | ලේකම් / செயலாளர / Secretary: 081-2213096 | සහකාරලේකම් / உதவிசெயலாளர் / Asst. Secretary: 081-5631321 | ෆැක්ස් / பெக்ஸ் / Fax: 081-2213082 |

මගේ අංකය / எனது இல. / My No. CPC/PSC/9/1/1/2022
ඔබේ අංකය / உமது இல / Your No.
දිනය / திகதி / Date 2022.10. 19

මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්,
සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, සභා ලේකම්,
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
සියළුම ආයතන ප්‍රධානීන් වෙත.

<u>මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සමඟ පැවැත්වූ සාකච්ඡාව සම්බන්ධවයි.</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් මා අමතා ඇති මධ්‍යම පළාත් ආණ්ඩුකාර ලේකම්ගේ අංක GCP/04/06/04 හා 2022.09.30 දිනැති ලිපිය හා 2022.09.26 දින ගරු ආණ්ඩුකාරතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ විශේෂ සාකච්ඡාවේ සටහන් හා බැඳේ.

02. ඒ අනුව, එහිදී ගත් තීරණ පහත පරිදි වන අතර, ඒ සම්බන්ධව අවධානය යොමු කර ඉදිරි කටයුතු සිදුකරන ලෙස කාරුණිකව දන්වමි.

- 2023 වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරිමේදි එක් සේවා ස්ථානයක වර්ෂ 05 කට වඩා වැඩි සේවා කාලයක් ඇති <u>සංවර්ධන නිලධාරි සේවය, කළමනාකරණ සේවා නිලධාරි සේවය, තාක්ෂණ නිලධාරි සේවය, මෝටර් රථ රියදුරු සේවය හා කාර්යාල කාර්ය සේවක සේවය</u> යන සේවාවන් වලට අදාල නිලධාරින් ස්ථාන මාරු කිරිම අනිවාර්යෙන් ක්‍රියාත්මක කළ යුතුය. කිසිදු හේතුන් මත එම නිලධාරින් රඳවා තබා නොගෙන ස්ථාන මාරුකිරිම් සිදුකල යුතු අතර, එම තනතුරු වලට අදාලව වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කර නොමැති නිලධාරින්ගේ විස්තරද ගෙන්වා ගැනීමට කටයුතු සිදුකල යුතුය.
- 2022 වාර්ෂික ස්ථාන මාරු නියෝග ලැබ දැනටමත් නව සේවා ස්ථාන වලට ස්ථාන මාරු කර නොමැති සංවර්ධන නිලධාරි සේවයේ නිලධාරින්, කළමනාකරණ සේවා නිලධාරි සේවයේ නිලධාරින්ගේ ස්ථාන මාරු ක්‍රියාත්මක කිරිමට කටයුතු කළයුතුය.

ටී.ඒ.ඩී.ඩබ්.දයානන්ද,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත.

පිටපත - ආණ්ඩුකාර ලේකම්, මධ්‍යම පළාත - කා.දැ.පි.